
# ජනාධිපතිවරයා තෝරාපත් කරගැනීම පිළිබඳ නීතිය



PAFFREL

# ජනාධිපතිවරයා තෝරාපත් කරගැනීම පිළිබඳ නීතිය

පැෆ්රල්

ප්‍රකාශනය - 2019. 10. 31

නිදහස් හා සාධාරණ මැතිවරණයන් සඳහා
ජනතා ක්‍රියාකාරිත්වය
**(PAFFREL)**

16, බෙයාර්ඩ් පෙදෙස, පාමංකඩ පාර, කොළඹ 06.

දුරකථන : (+94) 11 2 558 570 / 11 2 558 571 / 11 2 558 574

ෆැක්ස් : (+94) 11 2 558 572

විද්‍යුත් ලිපිනය : **paffrel@sltnet.lk**

**www.paffrel.lk**

# පටුන

**පිටු අංකය**


| | | |
|---|---|---|
| 1 | හැඳින්වීම | 01 |
| 2 | ජනාධිපති අපේක්ෂකයෙකු වීමට නුසුදුසුකම් | 02 |
| 3 | ජනාධිපතිවරණයේදී මනාප ලබා දීම | 03 |
| 4 | නාම යෝජනා භාර ගැනීම | 04 |
| 5 | ඡන්ද විමසීම ආරම්භ කිරීම | 06 |
| 6 | ඡන්ද විමසීම අවසන් කිරීම | 07 |
| 7 | ඡන්ද ගණන් කිරීම | 08 |
| 8 | ඡන්ද නියෝජිතයෝ | 09 |
| 9 | ඡන්ද වැරදි | 13 |
| 10 | දූෂණ ක්‍රියා | 19 |
| 11 | ජනාධිපතිවරණ පෙත්සම් | 25 |
| 12 | ඡන්දය දීමට යාම සඳහා නිවාඩු ලබා දීම | 26 |

# පෙරවදන

නව ජනාධිපතිවරයෙකු තෝරා පත් කර ගැනීම සඳහා ජනාධිපතිවරණය 2019 නොවැම්බර් 16 දින පැවැත්වීමට නියමිතය එවන් අවස්ථාවක ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීම සම්බන්ධයෙන් පවතින නෛතික රාමුව පිළිබඳ අවබෝධයක් තිබීම අත්‍යවශ්‍ය කරුණක් වේ.

ඒ අනුව 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ 1981 අංක 15 දරණ ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීමේ නීතිය සරලව හා සංෂිප්තව මෙය සංගෘහිත කර ඇත. විශේෂයෙන් ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීම සහ මැතිවරණ ප්‍රචාරණයට සම්බන්ධ වැරදි සම්බන්ධයෙන් වන ප්‍රතිපාදන පුරවැසියන්ගේ අවබෝධය වර්ධනය කිරීමට හේතු වනු ඇතැයි අපේක්ෂා කරමු.

රෝහණ හෙට්ටිආරච්චි
විධායක අධ්‍යක්ෂක

# හැඳින්වීම

1978 වර්ෂයට පෙර මෙරට පැවතියේ අගමැති ප්‍රමුඛ කැබිනට් මණ්ඩලයක් සහිත බ්‍රිතාන්‍ය වෙස්මිනිස්ටර් ආකෘතියේ ආණ්ඩුක්‍රමයකි. නමුත් 1978 දෙවන ජනරජ ව්‍යවස්ථාව මගින් විධායක ජනාධිපතිධුරයක් සහිත ආණ්ඩුක්‍රමයක් මෙරටට හඳුන්වාදීමට කටයුතු කරන ලදී.

එතැන් පටන් ක්‍රියාත්මක වන විධායක ජනාධිපතිධුරය ලාංකීය දේශපාලනයේ වඩාත් තීරණාත්මක දේශපාලන ආයතනය බවට පත්ව ඇත. එවන් සුවිශේෂී තත්වයක් අත්පත් කරගැනීමට විධායක ජනාධිපති ධුරයට හැකියාව ලැබී ඇත්තේ, රාජ්‍යයේ ප්‍රධානියා ලෙසත්, ආණ්ඩුවේ ප්‍රධානියා ලෙසත්, කැබිනට් මණ්ඩලයේ ප්‍රධානියා ලෙසත්, සේනාධිනායකයා ලෙසත්, පවතින බලතල නිසාවෙනි. කිසිදු ආකාරයකින් අධිකරණය හෝ ව්‍යවස්ථාදායකය මගින් සංවරණ සහ තුලන ක්‍රියාවලියකට යටත් නොවුණු ජනාධිපතිධුරය සම්බන්ධයෙන් එය ආරම්භ වූ අවස්ථාවේ සිටම තදබල විවේචන පැවතුණි. ඒ නිසාම ජනාධිපති ධුරය අහෝසි කිරීම යන්න මැතිවරණ වේදිකාවල ප්‍රධාන සටන් පාඨයක් ලෙස ජනතාව ඉදිරියේ තැබීමට ප්‍රධාන දේශපාලන පක්ෂවල නායකයන් කටයුතු කරනු දක්නට ලැබුණි. නමුත් පොරොන්දු වූ පරිදි විධායක ජනාධිපතිධුරය අහෝසි නොවුණි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ගෙනෙන ලද 17 වන සහ 19 වන සංශෝධන හරහා විධායක ජනාධිපතිධුරය ප්‍රජාතාන්ත්‍රීය ලෙස පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය යම් සංශෝධන කිහිපයක් පමණක් පසුකාලීනව සිදු විය.

## මූලික වශයෙන් ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීමට අදාළ නීතිමය රාමුව පහත පරිදි වේ.

- 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව (19 වන සංශෝධනය ද ඇතුළත්ව)
- සංශෝධිත 1981 අංක 15 දරණ ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම පිළිබඳ පනත.

**ඊට අමතරවඃ-**
**මැතිවරණ කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ සහ උපමාන.**

1978 ව්‍යවස්ථාවේ 7 වන පරිච්ඡේදයේ ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම සහ බලතල සවිස්තරව දක්වා ඇති අතර වර්ෂ 2015 දී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට එක් කරන ලද 19 වන සංශෝධනය මගින් ජනාධිපතිවරයාගේ එතෙක් වසර 6 ක් ලෙස පැවති ධූර කාලය වසර 5 ක් දක්වා අඩු කරන ලදී. තවද 18 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් ජනාධිපතිධූරයට තේරීපත්විය හැකි වාර ගණන අවිනිශ්චිත තත්වයක් දක්වා වෙනස් කරන ලද අතර නැවතත් 19 වන ව්‍යවස්ථා සංශෝධනය මගින් යම් පුද්ගලයෙකුට ජනාධිපතිධූරය සඳහා තේරීපත්විය හැකි වාර ගණන 2 ට සීමා කරන ලදී.

ඒ අනුව ජනාධිපතිවරණයක් ප්‍රකාශයට පත් කිරීම සහ ජනාධිපතිවරණය පැවැත්වීම 19 වන ව්‍යවස්ථා සංශෝධනය මගින් ඇති කරන ලද ජාතික මැතිවරණ කොමිෂන් සභාවේ කාර්යභාරයක් බවට පත්කර තිබේ.

## ජනාධිපති අපේක්ෂකයෙකු වීමට නුසුදුසුකම්.

- වයස අවුරුදු 35 සම්පූර්ණ කර නොතිබීම.
- ජනාධිපතිධූරය සඳහා දෙවරක් තේරී පත්ව තිබීම.
- ලාංකික පුරවැසියෙකු නොවීම.

- යම් මානසික හෝ ශාරීරික අබලතාවයක් හේතුවෙන් ජනාධිපතිවරයාට ඔහුගේ ධූරයේ කාර්යය ඉටු කිරීමට නියත වශයෙන්ම නොහැකි බව ශ්‍රේෂ්ඨාධිකරණයේ මතය වන අවස්ථාවක එකී මතය පාර්ලිමේන්තුව විසින් නොපැමිණි මන්ත්‍රීවරුන් ඇතුලුව මන්ත්‍රීවරු සංඛ්‍යාවෙන් 3/2 න් නොඅඩු යෝජනා සම්මතයක් මගින් සම්මත වී තිබීම.

## ජනාධිපතිවරණයේදී මනාප ලබා දීම

ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීමේ ඡන්ද විමසීම දැනට ධූරය දරන ජනාධිපතිවරයාගේ ධූර කාලය ඉකුත් වීමට මාසයකට නොඅඩු මාස 2කට නොවැඩි කාල සීමාවක් තුළ මැතිවරණ කොමසාරිස්වරයා විසින් පැවැත්විය යුතුය. ඡන්ද විමසීමේදී ජනාධිපති ධූරය සඳහා අපේක්ෂකයන් තිදෙනෙකු ඉදිරිපත් වී ඇති අවස්ථාවක ඡන්ද දායකයෙකුට තමන්ගේ දෙවන මනාපය ප්‍රකාශ කළ හැකි අතර අපේක්ෂකයන් තිදෙනෙකුට වඩා ඉදිරිපත්ව ඇති අවස්ථාවක දෙවන හා තෙවන මනාපය ප්‍රකාශ කළ හැකිය. ප්‍රකාශිත වලංගු ඡන්ද සංඛයාවෙන් 50% සහ තව එක් ඡන්දයකට වඩා වැඩි ඡන්ද සංඛ්‍යාවක් ලැබූ අපේක්ෂකයා ජනාධිපතිවරයා වශයෙන් තෝරා පත් කර ගත යුත්තේය.

**අපේක්ෂකයන් දෙදෙනෙක් පමණක් ඉදිරිපත් වූ අවස්ථාවක ඔවුන් එකිනෙකා සමාන ඡන්ද ප්‍රමාණයක් ලබා ගතහොත් ජයග්‍රාහකයා තෝරා ගැනීම සඳහා කුසපත් අදිනු ලැබේ.**

යම්කිසි ලෙසකින් කිසිදු අපේක්ෂකයෙකු ප්‍රකාශිත වලංගු ඡන්ද සංඛ්‍යාවෙන් 50%ක ප්‍රමාණයක් හිමි කරගෙන නොමැතිනම් එවිට වැඩිම ඡන්ද සංඛ්‍යාව හා දෙවන වැඩිම ඡන්ද සංඛ්‍යාවක් ලබාගත් අපේක්ෂකයන් හැර සෙසු අපේක්ෂකයින් තරගයෙන් ඉවත් කොට එක් එක් ඡන්ද දායකයාගේ දෙවන මනාපය ඉතිරි අපේක්ෂකයන් දෙදෙනාගෙන් එක් අයෙකුට දී ඇත්නම් එය ඔහු ලැබූ ඡන්ද සංඛ්‍යාවට එකතු කරනු ලැබේ. මේ අනුවද යම් අපේක්ෂකයෙකු වලංගු ඡන්ද සංඛයාවෙන් 50% සම්පුර්ණ නොකරයි නම් ඉහත අයුරින් එක් එක් ඡන්ද

දායකයාගේ තුන්වන මනාපයද ගණන් කොට බහුතර ඡන්ද සංඛ්‍යාවක් ලැබූ අපේක්ෂකයා ජනාධිපතිවරයා වශයෙන් තෝරා පත් කර ගත යුතුය.

**ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීම පිලිබඳ කාර්ය පටිපාටිය 1981 අංක 15 දරන පනත මගින් ස්ථාපිත කර ඇත.**

## නාම යෝජනා භාර ගැනීම

ජනාධිපතිවරයා තෝරා ගැනීම සඳහා මැතිවරණ කොමසාරිස්වරයා විසින් ගැසට් පත්‍රයේ නියමයක් පළ කළ යුතු අතර එම නියමය පළ කළ දිනයේ සිට දින 16කට නොඅඩු සහ දින 21 නොවැඩි කාල සීමාවක් තුළ යෙදෙන මැතිවරණ කොමසාරිස් විසින් නියම කරනු ලබන දිනයක් අපේක්ෂකයන්ගේ නාම යෝජනා කිරීමේ කාල සීමාව ලෙස සැලකිය යුතු අතර නාම යෝජනා භාර දීමෙන් පසුව සති 4කට නොඅඩු සහ සති 6කට නොවැඩි කාල සීමාවක් තුළදී ජනාධිපතිවරණය පැවැත්විය යුතුය. මෙම ඡන්ද විමසීමේ දිනය පසළොස්වක පෝය දිනයක් නොවිය යුතු අතර ප්‍රසිද්ධ නිවාඩු දිනයක්ද නොවිය යුතුය.

නාම යෝජනා කිරීමේ දිනයේ සිට සති 2ක් ඇතුලතදී මැතිවරණ කොමසාරිස් විසින් එක් එක් ඡන්ද බල ප්‍රදේශය තුළ ඡන්ද මධ්‍යස්ථාන පවත්වන ස්ථාන සඳහන් කරමින් දැන්වීමක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු අතර එක් ග්‍රාම නිලධාරී කොට්ඨාශයක් සඳහා එක් ඡන්ද මධ්‍යස්ථානය බැගින් එම ඡන්ද බල ප්‍රදේශය තුළම පිහිටුවිය යුතුය. නමුත් විශේෂ අවස්ථාවක්හිදී මෙම තත්වය වෙනස් විය හැකිය. ජනාධිපතිවරණයක් සඳහා නාම යෝජනා ඉදිරිපත් කිරීම තුන් ආකාරයකින් සිදු කළ හැකිය.

1. අපේක්ෂකයාගේ නම පිළිගත් දේශපාලන පක්ෂයක් විසින් යෝජනා කරන විට එම පක්ෂයේ ලේකම්වරයා විසින් නාම යෝජනා පත්‍රය අත්සන් කළ යුතුය
2. අපේක්ෂකයාගේ නම වෙනත් යම් දේශපාලන පක්ෂයකින් යෝජනා කරන විට එම පක්ෂයේ ලේකම්වරයා විසින් නාම යෝජනා පත්‍රයේ අත්සන් කළ යුතුය.

3. අපේක්ෂකයාගේ නම යම් ඡන්ද හිමියෙකු විසින් යෝජනා කරනු ලබන විට ඡන්ද හිමි නාම ලේඛනයේ නම ඇතුලත් ඡන්ද හිමියෙකු විසින් නාම යෝජනා පත්‍රය අත්සන් කළ යුතුය.

නාම යෝජනා ඉදිරිපත් කළ පසු ප්‍රතිවිරුද්ධ අපේක්ෂකයෙකු විසින් හෝ ප්‍රතිවිරුද්ධ අපේක්ෂකයාගේ නාම යෝජනා පත්‍රය අත්සන් කරනු ලැබූ තැනැත්තෙකු විසින් හෝ යම් අපේක්ෂකයෙකු සම්බන්ධයෙන් විරෝධතා ගොනු කිරීමට ඇත්නම් **කොමසාරිස්වරයා විසින් නියම කරනු ලබන වෙලාව තුළදී විරෝධතා දැක්විය හැකිය.**

එම විරෝධය දැක්වීමේ වලංගුභාවය පිළිබඳව කොමසාරිස්වරයා ප්‍රමාදයකින් තොරව නිර්ණය ලැබිය යුතු අතර යම් ලෙසකින් නාම යෝජනා ප්‍රතික්ෂේප කරයි නම් ඊට හේතු ද සහිතව අපේක්ෂකයාට දැන්විය යුතුය.

නාම යෝජනා භාර දීම සඳහා අපේක්ෂකයා සහ නාම යෝජනා පත්‍රය අත්සන් කළ තැනැත්තාත් තවත් එක් අයෙක් හැර මැතිවරණ කොමසාරිස්වරයාගේ අනුමැතියකින් තොරව වෙනත් කිසිදු තැනැත්තෙකුට පැමිණීමට නොහැක. නාම යෝජනා භාර දීමේ කාල සීමාව සහ විරෝධතා දැක්වීමේ කාල සීමාව ඉකුත් වූ වහාම නාම යෝජනා භාරදී ඇත්තේ එක් අපේක්ෂකයෙකු විසින් නම් එම අපේක්ෂකයා ජනාධිපතිධූරයට තෝරා පත් කරගෙන කොමසාරිස්වරයා විසින් ඒ බව දැක්වෙන දැනවෙන ගැසට් නිවේදනයක් නිකුත් කළ යුතුය. නාම යෝජනා පත්‍ර යම් ලෙසකින් එකක්වත් ලැබී නොමැති නම් දෙවන නාම යෝජනා කිරීමේ දිනයක් කොමසාරිස්වරයාට නියම කළ හැකි අතර එයද පෙර දක්වා ඇති ආකාරයට විය යුතුය. එක අපේක්ෂකයෙකුට වැඩි අපේක්ෂක සංඛ්‍යාවක් නාම යෝජනා භාරදී ඇති විට මැතිවරණ කොමසාරිස්වරයා විසින් ඡන්ද විමසීමක් පැවැත්විය යුතුය.

## මැතිවරණ ක්‍රියාවලිය ආරම්භ කිරීම

මැතිවරණ කොමසාරිස්වරයා විසින් නාම යෝජනා භාරගත් දිනයේ සිට දින 14ක් ඉකුත් වීමට පෙර ජනාධිපතිවරණය පැවැත්වෙන බවද, එය පැවැත්වෙන දිනය සහ ඡන්ද විමසීම පවත්වන වෙලාවද, ඡන්ද පත්‍රිකාවල සඳහන් කරනු ලබන පිළිවෙලට අපේක්ෂකයින්ගේ නම් සහ ඔවුනට වෙන් කරන ලද ඡන්ද ලකුණ ද, නාම යෝජනා කරන ලද දේශපාලන පක්ෂයේ හෝ ඡන්ද හිමියාගේ නමද, සඳහන් කරමින් ගැසට් පත්‍රයේ සහ පුවත්පත්වල දැන්වීමක්ද පළ කළ යුතුය.

නාම යෝජනා කර තිබියදී යම් අපේක්ෂකයෙකු මිය ගිය හොත් මැතිවරණ කොමසාරිස්වරයා විසින් නාම යෝජනා කරන ලද පක්ෂයේ ලේකම්වරයාට හෝ ඡන්ද හිමියාට වෙනත් අපේක්ෂකයෙකු නම් කරන ලෙසට දැන්විය හැකි අතර එසේ දින 3ක් තුළ වෙනත් අපේක්ෂකයෙකු පත් කරනු නොලැබුවහොත් ඉතිරි අපේක්ෂකයන් අතර පමණක් තරඟය පැවැත්විය හැකිය.

## තැපැල් ඡන්දය දීම

ජනාධිපතිවරයකදී තැපැල් ඡන්ද දීම සඳහා සුදුසුකම් ලබා සිටින ඡන්ද දායකයින්ට තැපැල් මගින් ඡන්දය ප්‍රකාශ කළ හැකි අතර ඡන්ද දිනයේ ඡන්ද පොළට ගොස් ඡන්දය ප්‍රකාශ කළ නොහැකිය.
ඡන්ද දිනයේදී මැතිවරණ කොමසාරිස්වරයාගේ විධි විධාන වලට යටත්ව තේරීම් භාර නිලධාරියා විසින් එක් එක් ඡන්ද මධ්‍යස්ථානයට ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයෙකු පත් කළ යුතු අතර ඡන්ද විමසීම පැවැත්වීම සඳහා අවශ්‍ය නිලධරයන් සහ සේවකයන් පත් කළ යුතුය.

එමෙන්ම සෑම ඡන්ද මධ්‍යස්ථානයක් වෙතම අදාල ඡන්ද බල ප්‍රදේශයේ ඡන්ද හිමියන්ගේ නාම ලේඛනයේ පිටපතක්, ඡන්ද දායකයන්ගේ සංඛ්‍යාව අනුව ඡන්ද පෙට්ටි සහ ඡන්ද පත්‍රිකා සහ අනෙකුත් උපකරණ සැපයිය යුතුය. ඡන්ද පොළක් තුළ ඡන්ද දායකයින්ට අවශ්‍ය උපදෙස් දැක්වෙන දැන්වීමක් සහ අපේක්ෂකයන්ගේ නම් ලකුණු ද ප්‍රදර්ශනය

කල යුතුය. මැතිවරණ කොමසාරිස්වරයා නියම කරනු ලබන දිනයේ පෙ.ව.7.00ට ඡන්ද විමසීම ආරම්භ කළ යුතු අතර එදින ප.ව. 5.00ට එය අවසන් කළ යුතුය.

## ඡන්ද විමසීම අවසන් කිරීම

නියමිත වේලාවට ඡන්ද පත්‍රිකා නිකුත් කිරීම නතර කළ යුතුය. (එසේ නොවන විට ඡන්ද පොළ නියෝජිතයින්ට එය පෙන්වා දිය යුතුය.)

**ඡන්ද විමසීම අවසන් වූ විටː-**
**ඡන්ද විමසීම අවසන් වූ වහාම ඡන්ද පොළ නියෝජිතයන් ඉදිරියේ දී පහත සඳහන් දේ කළ යුතුය.**

අ) ඡන්ද පෙට්ටි නිසි ලෙස මුද්‍රා තැබීම.

ආ) පාවිච්චි නොකළ හා නරක් වූ ඡන්ද පත්‍රිකා වෙනම පැකට්ටු වල දමා මුද්‍රා තැබීම.

ඇ) ලකුණු කරන ලද ඡන්ද නාමලේඛන පිටපත් කවරයක බහා මුද්‍රාව තැබීම.

ඉ) ඡන්ද පත්‍රිකා නිකුත් නොකරනු ලැබූ අයගේ ලැයිස්තු සකස් කිරීම.

ඊ) ද්විත්ව ඡන්ද ලැයිස්තුව කිරීම.

උ) ඡන්දදායකයන් වෙත නිකුත් කළ ඡන්ද පත්‍රිකා පොත් පිළිබඳ ලැයිස්තු සැකසීම.

ඌ) පාවිච්චි නොකරන ලද ඡන්ද පත්‍රිකා පිළිබඳ ලැයිස්තු සැකසීම.

**"ඡන්ද පත්‍රිකා විස්තරයක්" ද සකස් කොට අසුරා සීල් තබා බාරදිය යුතුය.**

## ඡන්ද ගණන් කරන ස්ථාන නියෝජිතයන්

ගණන් කරන ස්ථාන සඳහා නියෝජිතයන්ද පත් කළ යුත්තේ පක්ෂයේ ලේකම්, බලයලත් නියෝජිතයා හෝ කණ්ඩායමේ නායකයා විසිනි.

- එක් මධ්‍යස්ථානයක් ගණන් කරන ස්ථාන එකකට වඩා ඇති විට පස් දෙනෙකුද,
- ගණන් කරන ස්ථාන එකක් පමණක් ඇති විට දෙදෙනෙකුද නියෝජිතයන් වශයෙන් පත් කළ හැකියි.

ගණන් කිරීමේ නියෝජිතයන්ගේ නම් සහ ලිපිනයන් කල් ඇතිව ගණන් කිරීමේ නිලධාරියාට දැනුම් දී තිබිය යුතුය. ගණන් කරන අවස්ථාවේදී ජාතික හැඳුනුම් පත සමග පත්වීමේ ලිපියද රැගෙන එහි යා යුතුය. එම අවශ්‍යතා නැත්නම් ඇතුළුවීම ප්‍රතික්ෂේප කළ යුතුය.

## ඡන්ද ගණන් කිරීම.

- සියලුම ඡන්ද පෙට්ටි ලැබුණු පසු ගණන් කිරීම ආරම්භ කළ යුතුය.
- ගණන් කිරීමේ නියෝජිතයන් ඉදිරිපිටදී එක් එක් පෙට්ටියේ ඡන්ද පත්‍රිකා ගණන් කොට සටහන් කර, සියලුම පෙට්ටිවල ඡන්ද පත්‍රිකා මිශ්‍ර කළ යුතුය.
- ගණන් කරන විට ඡන්ද පත්‍රිකාවේ මුහුණත උඩුකුරුව තැබිය යුතුය. එහි අංකය පෙනෙන සේ නොතැබිය යුතුය.
- ඡන්ද ගණන් කිරීම අඛණ්ඩව කළ යුතුය. අවලංගු ඡන්ද පත්‍රිකා "අවලංගු කරන ලදී" යැයි පිටසන් කළ යුතුය.
- ගණන් කරන විට අදාළ නිලධරයන්ට සහ නියෝජිතයන්ට පමණක් එහි සිටිය හැකිය. (මෙහිදී ගණන් කිරීමේ නියෝජිතයන්ට, එම ඡන්ද පෙට්ටි නිසිපරිදි තිබේදැයි, අනෙක් කටයුතු නිසි පරිදි සිදුවේදැයි බලාසිට එසේ සිදු නොවේ නම් ස්ථානභාර ප්‍රධානියාටද පැමිණිලිකළ හැකිය.)
- ඡන්ද පත්‍රිකා මිටි බදිනා විට නියමිත පත්‍රිකා පමණක් ගොනු කරනවාද 50 මිටි සහ 500 මිටි නිසිලෙස සකස්වේ දැයි නියෝජිතයා විසින් පරික්ෂා කළ යුතුය.

- ඡන්ද පත්‍රිකාවක මුද්‍රා තබා හෝ සිදුරු නොකර ඇති විට එය ප්‍රතික්ෂේප නොකරනු ඇත. එහෙත් නියෝජිතයන් ගෙන් ද ඒ ගැන අදහස් විමසනු ඇත. නිසි අදහසක් දිය යුතුය. ඡන්ද පත්‍රිකාවක් ප්‍රතික්ෂේප කිරීමට පෙර එයද නියෝජිතයන්ට පෙන්වා අදහස් විමසනු ඇත.
- ප්‍රතික්ෂේප කරන ඡන්ද පත්‍රිකා ගණන් වෙන වෙනම දැක්වෙන ප්‍රකාශයක් සකස් කෙරේ. එය අවශ්‍ය නම් නියෝජිතයෙකුට පිටපත් කරගත හැකිය.
- එක් එක් පක්ෂ හෝ කණ්ඩායම් වලට දෙන ලද ඡන්ද සංඛ්‍යාව පිළිබඳව ලිඛිත ප්‍රකාශයක් සැකසේ. එයට නියෝජිතයන්ටද අත්සන් කළ හැකිය. පිටපත් කරගැනීමටද පුළුවන.
- ගණන් කිරීමේ නියෝජිතයෙකුට නැවත ගණන් කිරීමක් සඳහා ඉල්ලීමක් කළ හැකිය. ( උපරිම වාර දෙකකි.)
- ඡන්ද පත්‍රිකාවක් ගැන පැන නැගෙන ගැටලුවක් ගැන අවසාන තීරණය ගණන් කිරීමේ නිලධරයා සතුය.

## ඡන්ද මධ්‍යස්ථාන නියෝජිතයෝ

ඡන්ද දිනයේදී නියෝජිතකමට පත්කිරීමේ ලිපිය ඉදිරිපත් කළ යුතුය. එම ලිපිය ලබාගත යුත්තේ,

- පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්
- නැතිනම් ලේකම් බලයලත් නියෝජිතයා
- ස්වාධීන කණ්ඩායමක් නම් එහි නායකයා යන එක අයෙක්

විසිනි. එම පත්වීමේ ලිපියේ **නියෝජිතයාගේ නම, ලිපිනය, ජාතිය, හැඳුනුම්පත් අංකය සඳහන් විය යුතුය. එම හැඳුනුම්පත රැගෙන යායුතුය.**

- පත්වීම් ලිපි නිකුත් කිරීමට බලය ඇති තැනැත්තා ගැන ඡන්ද දිනට දින හතකට පෙර තේරීම්භාර නිලධරයාට දැනුම්දී තිබිය යුතුය.

- ඡන්ද පොළ නියෝජිතයෙකුගේ පත්වීම් අවලංගු කොට අලුත් නියෝජිතයෙකු පත් කිරීම සඳහාද ඉහත තොරතුරු සහිතව ලිඛිතව කළ යුතුය.
- එක් පක්ෂයක් හෝ කණ්ඩායමක් වෙනුවෙන් ඡන්ද මධ්‍යස්ථානයක නියෝජිතයන් දෙදෙනකුට වඩා රැඳී සිටිය නොහැකිය.

ඡන්ද ස්ථානාධිපතිවරයට ඡන්ද පොළේ යහපත් පැවැත්ම රැකගැනීමට අවශ්‍ය සහය දිය යුතුය. ඡන්ද මධ්‍යස්ථානයේ රැඳී සිටීමට බලය ඇති අය හැර වෙනත් අය බැහැර කළ හැකිය. එහෙයින් වෙනත් අය පැමිණෙන විට බැහැර කිරීමට මතක් කළ හැකිය.

## ඡන්ද විමසීම ආරම්භ කිරීමට පෙර

ඡන්ද ස්ථානාධිපතිවරයා විසින්, ඡන්ද පත්‍රිකා, නිල මුද්‍රාව, නිල ලකුණ සහ ඡන්ද හිමි නාමලේඛනවල පිටපත් ඡන්ද පොළ නියෝජිතයන්ට පෙන්විය යුතුය. ඡන්ද පෙට්ටිය හිස්ව තිබෙන බව පෙන්විය යුතුය. පසුව එය යතුරු දමා සිය මුද්‍රාව තැබිය යුතුය. අලුත් ඡන්ද පෙට්ටියක් පාවිච්චි කරන හැමවිටම එසේ කළ යුතුය.

**(ආරම්භයට පෙර ඉහත සඳහන් කටයුතු සිදුකළ යුතු බැවින් ඡන්ද පොළ නියෝජිතයන් පැයකටවත් කලින් ඡන්ද පොළට යා යුතුය.)**

## ඡන්ද පත්‍රිකා

ඡන්ද දායකයාගේ අංකය, නම හඬ නගා කියවිය යුතුය. අංකය උප පත්‍රිකාවේ යොදා පත්‍රිකාව වෙන්කළ යුතුය. නිල ලකුණින් එහි මුද්‍රාව තිබිය යුතුය. නැතහොත් සිඳුරු කළ යුතුය. ඡන්ද දායක නාමලේඛනයෙහි පත්‍රිකාව දුන් බවට ලකුණක් දැමිය යුතුය. එහෙත් ඒ ලකුණින් ඔහුට දුන් නිශ්චිත පත්‍රිකාව කුමක්දැයි දැනගැනීමට ඉඩ නොතැබිය යුතුය. ඉහත සඳහන් කරුණු නිසිලෙස සිදු නොවේනම් ඡන්ද පොළ නියෝජිතයාට ඒ බව ස්ථානාධිපතිට දැන්විය හැකිය. ඡන්ද

දායකයාගේ ඇඟිල්ලක නිසි පරිදි තීන්ත ආලේප කල යුතුය. තීන්ත ආලේප කිරීමට ඡන්ද දායකයෙකුට විරුද්ධ විය නොහැකිය. තීන්ත ආලේප නොකළ ඡන්ද හිමියෙකුට ඡන්ද පත්‍රිකාව නොදිය යුතුය. ඉහත සඳහන් කරුණු නිසිසේ ඉටු නොවන විට ස්ථානාධිපතිට පැමිණිලි කොට තමන් වෙතද ඒ පිළිබඳව සටහන් තබාගැනීම ඡන්ද මධ්‍යස්ථාන නියෝජිතයෙකුට කළ හැකිය.

## ඡන්ද දායකයන්ට සහයවීම

යම් ඡන්ද දායකයෙකු ඉල්ලා සිටියහොත්, ඡන්දය දීමේ ක්‍රමය ඔහුට පහදා දියයුතුය. ස්ථානාධිපති මගින් හෙවත් අදාළ නිලධරයෙකු විසින් එම උපදෙස් ඡන්ද මධ්‍යස්ථාන නියෝජිතයන්ට ඇසෙන සේ පහදා දිය යුතුය. අබල, දුබල, අන්ධ කෙනෙකු විසින් ඔහුට / ඇයට අවශ්‍ය ආකාරයට ඡන්ද ලකුණු කල යුත්තේ තවත් නිලධරයෙකු ඉදිරිපිටදීය. **ඉහත අවස්ථා වලදී ඡන්ද මධ්‍යස්ථාන නියෝජිතයා පරීක්ෂාවෙන් සිටිය යුතුය.**

යම් ඡන්ද දායකයෙකුගේ අනන්‍යතාවය ගැන සැකයක් ඇතිවුවහොත් හැඳුනුම්පත පිරික්සිය හැකිය. ස්ථානාධිපතිට ඡන්ද දායකයා ලවා "ඉ" , "ඊ", "උ" , "ඌ" යන ආකෘති පත්‍රිකා පුරවා අත්සන් ගතහැකිය. එම ප්‍රකාශ වලට අත්සන් කිරීම ප්‍රතික්ෂේප කළහොත් ඡන්ද පත්‍රිකාව නොදී සිටිය හැකිය. එහිදී අසත්‍ය ප්‍රකාශ කිරීම නීතියෙන් දඬුවම් ලැබිය හැකි වරදකි. (මහේස්ත්‍රාත් උසාවියෙන් දඩය රු.500, දඬුවම මාස 6 යි.)

ඉහත අවස්ථාවන්හිදී නිතිය අනුව ඒ කටයුත්ත සිදුනොවන විට ඒ බව ස්ථානාධිපති ට පෙන්වාදී සටහන් කර ගැනීමට ඉල්ලා සිටීමට ඡන්ද පොළ නියෝජිතයාට හැකිය.

## ඡන්ද කටයුතු යෙදෙන නිලධාරින්, නියෝජිතයන් සම්බන්ධ වගකීම් හා යුතුකම්

ඡන්ද මධ්‍යස්ථානයේ හෝ ගණන් කරන මධ්‍යස්ථානයේ ඡන්ද කටයුතුවල යෙදෙන නිලධාරීන්ගේ, නියෝජිතයන් එම ස්ථානයට පැමිණීමට බලය දෙනු ලැබූ නිලධරයන්, ලිපිකරුවන් , අපේක්ෂකයන් , නියෝජිතයන් විසින් රහස්‍යතා ප්‍රකාශයට අත්සන් කළ යුතුය.

- රහස්‍ය බව රැකීමත්, රැකීමට උදව් වීමත් ඔවුන් විසින් කළ යුතුය.
- ඡන්ද දායකයෙකුගේ නම හෝ අංකය හෝ නිල ලකුණක් ගැන හෝ නීතියේ සඳහන් පරිදි හැර, කිසිවෙකුට දැනුම්දීම නොකළ යුතුය.
- ඡන්දය දෙන හෝ දී ඇති පක්ෂය හෝ කණ්ඩායම හෝ ඡන්ද පත්‍රිකාවේ පිටපත්තේ අංකය හෝ දැනුම්දීම නොකළ යුතුය.
- ඡන්ද ගණන් කිරීමේදී ඡන්ද පත්‍රිකා සම්බන්ධ අංකය නිසැකව දැනගැනීම නොකළ යුතුය.
- ඡන්ද මධ්‍යස්ථානයේ දී ඡන්දය දැමීමට පෙර ඡන්ද දායකයා සමඟ කතාබහ නොකළ යුතුය.
- මේ යටතේ වරදකරුවකු වුවහොත් රු.500ක දඩයක් හෝ මාස 6ක සිරදඬුවමක් නියමවිය හැකිය. අවු. 7කට ප්‍රජා අයිතියද අහෝසි වේ.

**ඡන්ද මධ්‍යස්ථානයට ඇතුළුවිය හැක්කේ පහත සඳහන් අයට පමණි.**

1. ඡන්ද මධ්‍යස්ථානයට අවශ්‍ය කාර්ය මණ්ඩලය
2. එහි රාජකාරී නියමිත පොලිස් නිලධරයන්
3. ක්ෂේත්‍ර කටයුතු සඳහා පැමිණෙන භාරකාර නිලධරයන්
4. හැඳුනුම්පත සහ පත්වීමේ ලිපිය අතැති ඡන්ද මධ්‍යස්ථාන නියෝජිතයන්
5. අපේක්ෂකයන් (එක වරකට මධ්‍යස්ථානය තුල සිටිය හැක්කේ එක් අයෙකුට පමණි.)
6. තරග කරන දේශපාලන පක්ෂවල ලේකම්වරුන් / ස්වාධීන කණ්ඩායම් නායකයන්
7. ලියාපදිංචි ඡන්ද දායකයන් ඉහත සඳහන් නොවන වෙනත් අය ඇතුළුවීම දඬුවම් ලැබියහැකි වරදකි.
8. පිළිගත් මැතිවරණ නිරීක්ෂකයින්

# ඡන්ද වැරදි

- නාමයෝජනා පත්‍රයක් කූට ලෙස පිළියෙළ කිරීම, විරූප කිරීම, වංචනික ලෙස විනාශ කිරීම, එවැනි ලේඛනයක් දැනුවත්ව තේරීම්භාර නිලධාරියාට භාරදීම.
- ඡන්ද පත්‍රිකාවක නිල ලකුණ කූට ලෙස පිළියෙළ කිරීම, හොර පත්‍රිකා හැදීම, වංචනික ලෙස විරූප කිරීම හා වංචනික ලෙස විනාශ කිරීම.
- නිසි බලය නැතිව ඡන්ද පත්‍රිකා සැපයීම, ඡන්ද පත්‍රිකා විකිණීම හෝ මිලදී ගැනීම.
- ඡන්ද මධ්‍යස්ථානය තුලදී ලකුණු කළ ඡන්ද පත්‍රිකාවක් හිතා මතා ප්‍රදර්ශනය කිරීම.
- නීතියෙන් හිමිකමක් නැතිව සිටියදී, නිල ලකුණ සහිත ඡන්ද පත්‍රිකාවක් තමන් වෙත ලබාගැනීම.
- ඡන්ද දායකයෙකු ඡන්ද පෙට්ටියට, ඡන්ද පත්‍රිකාවක් නොවන වෙනත් දෙයක් දැමීම.
- ඡන්ද පෙට්ටියක් ඡන්ද පත්‍රිකා පැකට්ටුවක් නීතියෙන් බලය නැතිව විනාශ කිරීම, ලබාගැනීම, විවෘත කිරීම හෝ වෙනත් යමක් කිරීම.
- මැතිවරණයකදී නිසි බලය නැතිව ඡන්ද පත්‍රිකා මුද්‍රණය කිරීම.
- ඡන්ද පෙට්ටියකින් ඡන්ද පත්‍රිකා ඉවතට ගැනීමට, ඇතුලේ තිබියදී විවෘත කිරීමට යන්ත්‍රයක් හෝ ක්‍රමවේදයක් මැතිවරණ අවස්ථාවකදී තැනීම, පිටරටින් ගෙන්වීම, සන්තකයේ තබා ගැනීම, සැපයීම, පාවිච්චි කිරීම හෝ එම කාර්යන්ට ඉඩ සැලසීම.
- තැපැල් ඡන්දයේ දී අනන්‍යතා ගැන බොරු ප්‍රකාශ කිරීම.
- තැපැල් ඡන්ද දායකයෙකු වීමට කර ඇති ඉල්ලීමක්, අනන්‍යතා ප්‍රකාශයක්, ආවරණ ලියුම් කවරයක්, තැපැල් ඡන්ද පත්‍රිකා කවරයක් නිසි බලය නැතිව විවෘත කිරීම, විනාශ කිරීම, එයට යමක් එකතු කිරීම

- නිල ඡන්ද දැන්වීම් පත්‍රිකාවක් ලෙස පෙනෙන හෝ සැලකිය හැකි යමක් බලය නැතිව මුද්‍රණය කිරීම.
- ඡන්ද විමසන අවස්ථාවකදී, ඡන්ද දායකයෙකුට වරදවා වටහා ගනු ලැබිය හැකි ලකුණක් හෝ දෙයක් තැබීම.
- ඡන්ද විමසන අවස්ථාවකදී, ඡන්ද දායකයෙකු සම්බන්ධයෙන් තබන ලද උචිත ලකුණක් නිසි බලය නැතිව, වංචනික ලෙස විරූප කිරීම.
- ඡන්ද දීමට නිත්‍යානුකූල නුසුදුස්සෙකුව සිටියදී ඒ බව දැන දැනම ඡන්දය දීම.
- ඉහත සඳහන් වැරදිවලට යම් තැනැත්තකු වරදකරුවෙකු වේ නම් 1981 අංක දරන පනත යටතේ දඬුවම් ලබාදිය හැකිය.

**ප්‍රජා අයිතිය නැති වූ අයට අවුරුදු හත ඉක්ම යනතෙක් ඡන්දය භාවිතා කළ නොහැකිය.**

- අපේක්ෂකයෙකු වෙනුවෙන් ඡන්දය ඉල්ලීම.
- අපේක්ෂකයෙකුගේ නියෝජිතයෙකු වීම.
- කථා පැවැත්වීම හෝ මැතිවරණයකදී කවර ආකාරයකින් හෝ සහභාගී වීම නොකළ යුතුය.

එසේ කළහොත් මහේස්ත්‍රාත් උසාවියකින් රු.1000ක දඩයක් හෝ මාස 6ක සිරදඬුවමක් හෝ ඒ දෙකින්ම දඬුවම් ලැබිය හැකිය.

## ඡන්දය දිනයේ තහනම් ක්‍රියා

ඡන්ද මධ්‍යස්ථානයක ඡන්ද කටයුතු පැවැත්වෙන කාලය තුළදී එම ස්ථානයෙන් කිලෝමීටර් භාගයක් ඇතුලත, පහත සඳහන් ක්‍රියා තහනම් කර ඇත.

- ඡන්දය දෙන ලෙස ඡන්ද හිමියන්ගෙන් ඉල්ලීම.
- නිශ්චිත ඡන්ද දායකයෙකුගේ ඡන්දය ඉල්ලීම.
- නිශ්චිත පක්ෂය කට හෝ කණ්ඩායමකට ඡන්දය නොදෙන ලෙස ඡන්ද හිමියෙකු පෙළඹවීම.
- සමස්ත මැතිවරණයේ දීම ඡන්දය නොදෙන ලෙසට ඡන්ද හිමියෙකු පෙළඹවීම.

- ඡන්ද විමසීම සම්බන්ධ (නිල ලේඛනයක් නොවන ) අත් පත්‍රිකාවක්, ප්‍රදර්ශන පත්‍රයක්, දැන්වීමක්, චිත්‍රයක්, ඡයාරූපයක් හෝ පිළිගත් පක්ෂයකට හෝ කණ්ඩායමකට අයත් ලකුණක් බෙදා හැරීම හෝ ප්‍රදර්ශනය කිරීම.

**දඬුවම: මහේස්‍රාත් උසාවියේ ලඝු නඩු විභාගයකින් පසුව වරද ඔප්පු වුවහොත් රු.100ක දඩයක් හෝ මාසයක සිර දඬුවමක් හෝ ඒ දෙකම නියමවිය හැකිය.**

## ඡන්ද මධ්‍යස්ථානය අසල වැරදි හැසිරීම

ඡන්ද මධ්‍යස්ථාන සීමාව ඇතුලත දී ඡන්ද මධ්‍යස්ථානයට පැමිණෙන අයට, රාජකාරී කරන නිලධාරීනට හෝ වෙනත් අයගේ වැඩට බාධාවන පරිදි.

- ශබ්ද විකාශන උපක්‍රම  භාවිතා කිරීම
- කෑ ගැසීම
- අසංවර ලෙස හැසිරීම තහනම්ය.

එයටද ඉහත සඳහන් දඬුවම් නියම විය හැකිය. එවැනි ක්‍රියා මැඩපැවැත්වීමට පොලිසියට බලය පාවිච්චි කිරීමටත්, යම් දේවල් අත්අඩංගුවට ගැනීමටත් 1981 අංක 15 දරණ පනත යටතේ ප්‍රතිපාදන සලසා ඇත.

## පෙරහැර, පෙළපාලි ආදිය පැවැත්වීම.

මැතිවරණයට නාමයෝජනා භාරදුන් දින දක්වා පෙරහැරවල්, පෙළපාලි මෙහෙයවීම, පැවැත්වීම හෝ සහභාගිවීම තහනම් වේ. මැතිවරණයට අනුබල නොදෙන අයුරින් ආගමික හා සාමාජික කාර්ය සඳහා පෙරහැරවල් පැවැත්වීමට පුළුවන. (උදාහරණ :මැයි දින පෙළපාලියක්, පොසොන් පෙරහැරක් ආදිය.) **නීතිය කඩකළ හොත් දඬුවම මාසයක සිර දඬුවමක් රු.100ක දඩයක් හෝ ඒ දෙකම.**

## මහජන රැස්වීම් පැවැත්වීම

මැතිවරණයට දෙදිනකට පෙර ( පැය 48 කට පෙර) සිට ප්‍රතිපල නිකුත්වී සතියක් ගතවන තෙක් මහජන රැස්වීම් පැවැත්වීම තහනම් වේ. **(මාසයක සිර දඬුවමක් හෝ රු. 100ක දඩයක් හෝ ඒ දෙකම මහේස්ත්‍රාත් උසාවියකින්) උසාවියකින්)**

## ඉහත වැරදි කිරීම සඳහා තැත්කිරීම ද වරදකි.

ඉහත වැරදි සඳහා නඩු පැවරීම සඳහා නීතිපතිවරයා ගේ අනුමැතිය ලබාගත යුතුය. **(පසුගිය කාලයන්හි එසේ පැමිණිලි කරනු ලැබ සමහර වැරදිවලට නඩු පැවරීමට නීතිපතිවරයා අනුමැතිය දී ඇත.)**

## අපේක්ෂකයන් නොවන අයගේ ඡන්ද කටයුතු

මුද්‍රණකරුගේ හා ප්‍රකාශකගේ නම හා ලිපිනයන් සඳහන් නොවන, ප්‍රචාරක දැන්වීම්, අත්පත්‍රිකා, පෝස්ටර්, මුද්‍රණය කිරීම, පල කිරීම, බෙදාහැරීම, අලවා තැබීමට සැලසීම අපේක්ෂකයෙකු නොවන කෙනෙකු කරන වරදකි. ඒ සඳහා මහේස්‍රාත් උසාවියෙන් රු.500ක දඩයක් නියමවිය හැකිය. (එසේ සඳහන් නොකිරීම ස්වභාවයෙන් සිදුවූ අතපසු වීමක් නම් එය ඔප්පු කල යුතුය.)
**(සැ. යු. - අපේක්ෂකයෙකු හෝ ඔහුගේ නියෝජිතයෙකු එසේ කිරීම "නීතිවිරෝධී ක්‍රියා" යටතේ වරදක් වේ.)**

## මැතිවරණ කාර්යාල ගණන

මැතිවරණ කාර්යාල සාමාන්‍යයෙන් ඡන්ද කාර්යාල යනුවෙන් ද භාවිතා වේ. එවැනි කාර්යාල වර්ග දෙකකි. එකක් එක් මධ්‍ය කාර්යාලයකි. අනෙක් ඒවා ශාඛා කාර්යාල වේ. මධ්‍ය කාර්යාලය එක් මැතිවරණ කොට්ටාශයකට එකකි. ( Election District) ශාඛා කාර්යාල එක් එක් ඡන්ද කොට්ටාශයේ එක් ඡන්ද කාර්යාලය බැගිනි. (polling division) කාර්යාල පැවැත්විය යුත්තේ එම කොට්ටාශයේ බලයලත් නියෝජිතයෙකු හෝ කණ්ඩායම් නායකයෙකු විසින් පමණි.

## කාර්යාල පැවැත්විය යුතු සීමාව

- මධ්‍ය කාර්යාලය, නාමයෝජනා දිනයෙන් පටන්ගෙන ඡන්දය විමසන දිනයට පෙර දිනයෙන් අවසන් විය යුතුය.
- ශාඛා කාර්යාල එතැන් සිට, එනම් ඡන්දය විමසන දිනයට පෙර දිනයෙන් පටන්ගෙන පසු දිනය දක්වා විය යුතුය.
- මේ අනුව ඒ කාර්යාල වර්ග දෙකම එකවිට පැවැත්විය නොහැකිය. **දිස්ත්‍රික් කාර්යාලය අවසන් කොට ශාඛා කාර්යාල පටන්ගත යුතුය.**

මෙම කාර්යාල පැවැත්වීම ගැන දිස්ත්‍රික්කයේ තේරීම්භාර නිලධාරියාටත්, ප්‍රදේශයේ පොලිස් ස්ථානාධිපතිටත් දැනුම් දී තිබිය යුතුය. ඒ නිසා ඒවා නිවේදන (notified) කාර්යාල වශයෙන් හැඳින්වේ. **ඉහත සීමාව යටතේ** අපේක්ෂකයෙකුගේ නිවස මැතිවරණ කාර්යාලයක් ලෙස පැවැත්විය හැකිය. මෙම නීතිය කඩ කිරීම ද, කඩ කිරීමට තැත් කිරීම ද වරදකි. නඩු පැවරීමට නීතිපතිගේ අනුමැතිය අවශ්‍ය වේ. **වරදට දඬුවම රු.100 ක දඩයක් හෝ මාසයක සිර දඬුවමක් හෝ ඒ දෙකම විය හැකි ය.**

අපේක්ෂකයෙකුට හිමි ඡන්ද සලකුණ ප්‍රදර්ශනය කල හැක්කේ පහත සඳහන් අවස්ථා වල පමණකි. අපේක්ෂකයෙකු ගමන් ගන්නා වාහනයක හෝ අපේක්ෂකයෙකුට ආධාර පිණිස පවත්වන රැස්වීමකදී, එම ස්ථානයේ එම දිනයේ පමණක් ඒවා ප්‍රදර්ශනය කළ හැකි ය. එසේ නොකොට ඡන්ද සලකුණ ප්‍රදර්ශනය කිරීම වැරදි ක්‍රියාවකි. එවිට වරෙන්තුවක් නොමැතිව අත් අඩංගුවට ගත හැක. එම වැරදි ක්‍රියා හෝ තැත් කිරීම් වැළැක්වීමට පොලිස් නිළධාරීන්ට බලය පාවිච්චි කල හැකිය. **මහේස්ත්‍රාත් උසාවියක ලඝු නඩු විභාගයකින් පසු මාසයක සිර දඬුවමක් හෝ රු 100 ක දඩයක් හෝ ඒ දෙකම නියම විය හැකිය. පොලිස් නිළධාරීන්ට එම ද්‍රව්‍ය අත් අඩංගුවට ගැනීමට හෝ ඉවත් කිරීමට බලය ඇත.**

## ඡන්දය ඉල්ලීම්

නාම යෝජනා අවසන් දින සිට ඡන්දය විමසීම් දිනට පසු දිනය දක්වා ඡන්ද අපේක්ෂකයෙකු/අපේක්ෂිකාවක් හෝ පවුලේ කෙනෙකු (පවුලේ

අය යනුඃ සැමියා, බිරිඳ, දුව, පුතා, පුතාගේ බිරිඳ, දුවගේ සැමියා) පහත සඳහන් දේ කිරීම වරදකි.

- ඡන්ද ඉල්ලීමට නිවෙස්වලට යාම
- පක්ෂයකට හෝ අපේක්ෂකයෙකුට ඡන්දය නොදෙන ලෙසට පෙළඹවීම.
- මැතිවරණයේ දී ඡන්දය පාවිච්චි නොකරන ලෙසට පෙළඹ වීම, අත් පත්‍රිකා, ප්‍රදර්ශන පත්‍ර, දැන්වීම්, චිත්‍ර, ඡායාරූප, ලකුණු ප්‍රදර්ශනය කිරීම.

**මෙම වරද කළොත් අපේක්ෂකයා /අපේක්ෂිකාව මහේස්‍රාත් උසාවියෙන් රු 100 ක දඩයක් හෝ මාසයක සිර දඬුවමක් හෝ ඒ දෙකම ලබනු ඇත.**

## රහස්‍ය භාවය රැකීම/රහස්‍ය භාවය

ඡන්දපොළට හෝ ගණන් කරන ස්ථානයට පැමිණ සිටීමට බලය ලබන නිලධරයන් ලිපිකරුවන්, නියෝජිතයන්, අපේක්ෂකයන් නියමිත රහස්‍ය කතා ප්‍රකාශයට අත්සන් තැබිය යුතුය. එම ප්‍රකාශ පහත සඳහන් වැරදි නොකරන බවට දෙන පොරොන්දුවකි.

- ඡන්ද පත්‍රිකාවක් සඳහා ඉල්ලුම් කර ඇති හෝ නැති යම් ඡන්ද හිමියෙකුගේ නම, අංකය, හෝ නිල ලකුණ ගැන යම් තොරතුරක් ඡන්ද විමසීම අවසන් කිරීමට පෙර නිම කිරීම.
- ඉහත සඳහන් අය විසින්, යම් ඡන්ද දායකයෙකු ඡන්දය දෙන්නට යන්නේ හෝ දුන්නේ කුමන පක්ෂයටද හෝ කණ්ඩායමටද යන විස්තර ඡන්ද මධ්‍යස්ථානයේදී ලබා ගැනීමට තැත් කිරීම.
- ඡන්ද දායකයෙකුට දෙන ලද ඡන්ද පත්‍රිකාව පිට පැත්තේ අංකය ගැන තොරතුරක් යම් තැනැත්තෙකුට දැනුම් දීම.
- ඉහත සඳහන් අය විසින්, ඡන්ද ගණන් කිරීමේදී පත්‍රිකාවක පිට පැත්තේ සඳහන් අංකය දැනගැනීමට තැත් කිරීම.

- ඡන්ද පත්‍රිකාවක් මගින් ඡන්දය දී ඇති පක්ෂය හෝ කණ්ඩායම ගැන තොරතුරු කිසිවෙකුට දැනුම් දීම.

- යම් පනතකින් බලය ලත් ස්ථානාධිපති විසින් හෝ ස්ථානාධිපතිගේ බලය ලත් තැනැත්තෙකු විසින් හැර වෙනත් අයෙකු විසින් ඡන්ද දායකයෙකු ඡන්ද පත්‍රිකාව පෙට්ටියට දැමීමට පෙර එම ඡන්ද දායකයා සමග කතා බහ කිරීම.

- ඉහත වැරදි ක්‍රියා සඳහා තැත් කිරීම ද වරදකි.

- මහේස්ත්‍රාත් උසාවියේ ලඝු නඩු විභාගයකින් පසු රු. 500 ක දඩයක් හෝ මාස හයක සිර දඬුවමක් හෝ ඒ දෙකම නියම විය හැකිය. **වරදකරු වීම නිසා අවුරුදු 7කට ඡන්ද බලය අහිමි වේ.**

## දූෂණ ක්‍රියා සම්බන්ධ දඬුවම්

**පහත සඳහන් වැරදි මැතිවරණ දූෂණ ක්‍රියා වශයෙන් හඳුන්වා ඇත:**

### හොර ඡන්ද දැමීම

ජීවත්ව සිටින හෝ මිය ගිය කෙනෙකු වෙනුවෙන් පෞද්ගලිකව හෝ තැපෑලෙන් ඡන්දය දීමත්, තමාගේ නමින්ම එක් වරකට වඩා ඡන්දය දීමත් හොර ඡන්ද දැමීම වේ.

- මේ සඳහා ඡන්දය දමා තිබීම අවශ්‍ය නැත. ඡන්ද පොළකින් ඡන්දය දැමීමට ඡන්ද පත්‍රිකාවක් ඉල්ලුම් කිරීම මගින් ,
- තැපැල් ඡන්ද ඉල්ලුම් කිරීම මගින්,
- තැපැල් ඡන්ද පත්‍රිකාවක් ලකුණු කිරීම මගින් එම වරද සම්පූර්ණ වේ. **මේ සඳහා වරෙන්තුවක් නැතිව අත්අඩංගුවට ගත හැකිය.**

### සංග්‍රහ කිරීම

- මැතිවරණයට පෙර හෝ පසුව හෝ පසු හෝ ඒ අතරතුර හෝ ඡන්දය දීම සඳහා නැත්නම් නොදීම සඳහා සංග්‍රහ කිරීම වරදකි.

- තමන් විසින්ම හෝ වෙන කෙනෙකු මාර්ගයෙන් කිරීම වැරදිය. තවත් කෙනෙකුගේ ඡන්දය ලබා ගැනීම, හෝ ඡන්දය නොදැමීම පිණිස කෙනෙකුට සංග්‍රහ කිරීම ද වැරදිය.

## සංග්‍රහ කිරීමට පහත සදහන් දේ ඇතුළත්ය.

- කෙළින්ම හෝ වෙනත් මගකින් කෑමක් බීමක් හෝ අන්න පානයක් හෝ ආහාර ද්‍රව්‍යක් දීම හෝ සැපයීම.
- එවැනි දේ ලබා ගැනීම පිණිස බලපත්‍රයක් හෝ වෙනත් උපක්‍රමයක් යෙදීම.
- එවැනි දේ සැපයීමේ යම් වියදමක් ගෙවීමට පොරොන්දු වීම එවැනි සංග්‍රහයක් දීම හෝ සැපයීම මෙන්ම එය ලබා ගැනීම හෝ ලැබීමේ උපක්‍රමයක් යෙදීමද සංග්‍රහ කිරීමේ වරදට අදාළ වේ .

## අයුතු බලපෑම්

අයුතු බලපෑම් යනු ඡන්ද බලය නිදහසේ පාවිච්චි කිරීමට හෝ නොකිරීමට බාධා කිරීම හෝ පෙළඹවීම වේ. යම් මැතිවරණයකදී ඡන්දය ලබා දීම හෝ නොදීමට පෙලඹ වීම හෝ බල කිරීම සඳහා සහ වැළකී සිටීම නිසා කෙලින්ම හෝ වෙනත් විදියකින් අයුතු බලපෑම් කල හැකි ය. තමන් විසින් හෝ වෙනත් අයෙකු මගින් යම් තැනැත්තෙකුට හෝ ඔහු වෙනුවෙන් වෙනත් කෙනෙකුට අයුතු බලපෑම් කළ හැකිය. බලපෑමක්, සාහසිකකමක්, අවහිරයක් තර්ජනයක් කෙලින්ම හෝ වෙනත් කෙනෙකු මගින් කල හැකිය. මේ බලපෑම් වල භෞතික හෝ මානසික පීඩාවක්, පාඩුවක්, හානියක් සාපයක් කරන බවට තර්ජනය කිරීම, පැහැරගෙන යන බවට ඇගවීම මගින් නිදහස් ඡන්දය දීමට බාධා කිරීම සිදුවේ.

නාම යෝජනා දිනයේ සිට ඡන්ද විමසන දිනට පසුදා දක්වා කාලයේ දී යම් පක්ෂයකට හෝ කණ්ඩායමකට ඡන්දය දීමට හෝ නො දීමට පෙළඹවීම සදහා ආගමික රැස්වීමකදී කියා සිටීම. එවැනි ආගමික රැස්වීමකදී මැතිවරණය සදහා පත්‍රිකා, දැන්වීම් චිත්‍ර ඡායාරූප ලකුණු

කොඩි බෙදා හැරීම් හෝ ප්‍රදර්ශනය කිරීම මැතිවරණයේ යෙදෙන පක්ෂයකට හෝ කණ්ඩායමකට හෝ ආධාර පිණිස පූජනීය ස්ථානයක මහජන රැස්වීමක් පැවැත්වීම අයුතු බලපෑමේ වරද වේ.

මැතිවරණ හේතු මත පූජනීය කටයුතු නොකරන බවට තර්ජනය කිරීම හෝ එම ආගමික සංවිධානයෙන් බැහැර කරන බවට තර්ජනය කිරීම අයුතු බලපෑම වේ. පක්ෂයකට හෝ කණ්ඩායමකට ඡන්දය දීම හෝ නොදීම පිණි ස හෝ ඡන්දය දී තිබීම හෝ ඡන්දය දීමෙන් වැළකීසිටීම නිසා සේවා යෝජකයා,

- රැකියාව අහිමි කිරීම හෝ එසේ කරන බවට තර්ජනය කිරීම
- රැකියාවේ යෙදී සිටිය දී භුක්තිවින්දා වූ හෝ භුක්ති විඳීමට තිබෙන ප්‍රතිලාභ හෝ සේවා ප්‍රතික්ෂේප කිරීම හෝ එසේ කරන බවට තර්ජන කිරීම ද අයුතු බලපෑම් වේ.

## අල්ලස් දීම

- ඡන්දය දීම හෝ නොදීම සඳහා ඡන්ද හිමියෙකු පෙළඹවීමට දෙන "දීමනාවකි" එය වක්‍ර මාර්ගයකින් දීමක් විය හැකිය. ඡන්ද හිමියා වෙනුවෙන් වෙනත් කෙනෙකුට දෙන දීමනාවක් ද ඇතුළත් වේ.
- එසේ දෙන දේ මුදලක්, ණයක් හෝ වෙනත් දෙයක් විය හැකිය. දීමට පොරොන්දු වීම, ලබා දීමට උත්සාහ කරන බවට පොරොන්දු වීම ද අල්ලස් දීමකි.
- ඡන්දය දී තිබීම නිසා හෝ ඡන්දය දීමෙන් වැළකී සිටීම ගැන ඉහත කී ක්‍රියාවක් කිරීම ද වරදට ප්‍රමාණවත් වේ. එසේ දෙන දේ, දීමට පොරොන්දු වන දේ නිලයක්, තනතුරක්, රැකියාවක් විය හැකිය. ඡන්දය දුන් නිසා හෝ නොදුන් නිසා එසේ කිරීම ද අල්ලසකි.
- එසේ දෙන දේ (කෙළින්ම හෝ වක්‍ර මාර්ගයෙන් ) තෑග්ගක්, ණයක්, යෝජනාවක්, පොරොන්දුවක් ලබා දීමක් හෝ ගිවිසුමකින් වූව ද වරද සිදුවේ. ඒ අනුව ඡන්දයක් ලබා දීම සඳහා පොරොන්දු වීම වැරදිය.

## ලබා ගන්නා ඡන්ද හිමියා ද වැරදිකරු වීම

මැතිවරණයට පෙර හෝ එය පැවැත්වෙද්දී හෝ එසේ යම් දෙයක් ලබා ගැනීම, එකඟ වීම, ගිවිසුමක් ඇති කර ගැනීම මගින් ඡන්ද හිමියා ද අල්ලස් ගැනීමේ වරද කරයි.

ඉහත විස්තර වූ ආකාරයේ අල්ලසක් තමන් විසින්ම හෝ වෙනත් තැනැත්තෙකු මගින් කෙළින්ම හෝ වක්‍ර ආකාරයකින් ඉල්ලුම් කරන තැනැත්තා ද අල්ලසට වරදකරු වේ. ඉහත සඳහන් පරිදි අල්ලසක් දීමට හෝ ලබා දීම පිණිස උත්සාහ කරන බවට පොරොන්දු වන තැනැත්තා ද අල්ලස් දීමේ වරද කරයි.

## මහාධිකරණය දූෂණ ක්‍රියා සම්බන්ධ දඬුවම්

හොර ඡන්ද දැමීම, හොර ඡන්ද දැමීමට අනුබල දීම, සංග්‍රහ කිරීම, අයුතු බලපෑම, අල්ලස් දීම, චරිත ඝාතනය කිරීම, අපේක්ෂකයෙකු ඉල්ලා අස් වූ බවට අසත්‍ය ප්‍රකාශ කිරීම මැතිවරණ දූෂණ ක්‍රියා සම්බන්ධයෙන් දඬුවම් ලැබීමට හේතු වේ. හොර ඡන්ද දැමීම ගැන දඩය රු. 500කි. සිර දඬුවම බරපතල වැඩ සහිතව මාස 12කි. අනිත් වැරදිවලට රු.500ක් හෝ මාස 6ක් හෝ ඒ දෙකමය.

- මේ සම්බන්ධ නඩු විභාගය සිදුවන්නේ මහාධිකරණයේ ය.
- නඩු පැවරීමට නීතිපතිගේ අනුමැතිය අවශ්‍යය.
- වරදකරු වුවහොත් අනික් දඬුවම් වලට අමතරව අවුරුදු 7කට ප්‍රජා අයිතිවාසිකම්ද අහිමි වේ. මන්ත්‍රී ධූරයක් වී නම් එය ද අහෝසි වේ.

## නීති විරෝධී ක්‍රියා

මැතිවරණයකදී කරනු ලබන ඇතැම් ගෙවීම් හෝ වියදම් නීති විරෝධී ක්‍රියාවන් ලෙස මේ කොටසේදී සැලකේ.

- ඡන්ද මධ්‍යස්ථානයේ සිට හෝ ඡන්ද ස්ථානය වෙතට හෝ ඡන්ද හිමියන් ප්‍රවාහනය සඳහා කවර ආකාරයක හෝ ගමන් ගාස්තු ගෙවීම හෝ ගෙවීමට ගිවිස ගැනීම නීති විරෝධී ක්‍රියාවකි.
- පත්‍රිකා, දැන්වීම් ආදිය ප්‍රදර්ශනය සඳහා හෝ ප්‍රදර්ශනය සඳහා ස්ථානයක් පාවිච්චි කිරීම නිසා ඡන්ද හිමියෙකුට ගෙවීමක් කිරීම හෝ ගෙවීමට ගිවිසුමක් ඇති කර ගැනීම මෙන්ම ගෙවීමක් ලැබීමත් ගිවිසුමට පාර්ශවකරුවෙකු වීමත් වැරදිය.
- ඡන්දය විමසීමට පැයකට පෙර සහ එය අවසන් වී පැයකට පසු යන කාලය අතරතුර, ඡන්ද ස්ථානයට හෝ ඒ ස්ථානයේ සිට ඡන්ද දායකයන් ප්‍රවාහනය කිරීම සඳහා ආධාර අනුබල දීම නොකළ යුතුය. නීත්‍යානුකූල කටයුත්තක් හෝ නිළ කටයුත්තක් කල හැක.

**ඉහත සඳහන් ක්‍රියා නීති විරෝධී නොවන අවස්ථා මෙසේය.**

- යම් ඡන්ද හිමියෙකු සිය ව්‍යාපාර කටයුත්තක් වශයෙන් ගාස්තු අය කර පත්‍රිකා හා ප්‍රචාරක දැන්වීම් මුද්‍රණය කිරීම නීති විරෝධී නොවේ.
- ගංගාවකින් හෝ නොගොස් ඡන්දය දිය නොහැකි අවස්ථාවක ඡන්ද හිමියන්ට මුහුදින් හෝ ගඟින් එතෙර වීමට ඉඩ සැලසිය හැකිය.
- පොදු ප්‍රවාහන සේවය මගින් තමන්ගේ අතින් වියදම් කර ඡන්ද පොළට යාම ඊම නීති විරෝධී ක්‍රියාවක් නොවේ.
- ඡන්ද දිනට දින 7කට පෙර තේරීම් භාර නිලධාරියාගෙන් ලබාගත් ලිඛිත අවසරයක් ඇතිව, ශාරීරික දුබලතාවයක් ඇති තැනැත්තෙකුට ඡන්ද පොළට යාමට හෝ ඊමට ගමන් පහසුවක් යොදාගත හැකිය. (අපේක්ෂකයෙකු විසින්, ඡන්ද හිමියෙකු වෙනුවෙන් එම ලිඛිත අවසරය ඉල්ලා නොසිටිය යුතුය.
- නීති විරෝධී ලෙස ක්‍රියා කරන විට, තමන්ගේ මෙහය වීමෙන්

හෝ පැමිණිල්ලක් මත පොලිස් නිලධාරියෙකුට එම වාහනය අත්අඩංගුවට ගෙන ඡන්ද විමසීම අවසන් වන තෙක් පොලිස් ස්ථානයේ රඳවා තබා ගත හැකිය.

- නීති විරෝධී ක්‍රියාවකට වරදකරු වුවහොත්, එම කටයුත්තට යොදාගත් වාහනය රාජසන්තක කිරීමට මහාධිකරණයට බලය පවතී.

## අසත්‍ය ප්‍රකාශ කිරීම

යම් පුවත්පතක සඟරාවක්, පත්‍රිකාවක්, හෝ ප්‍රකාශනයක් මගින් අසත්‍ය වූ යමක් පල කිරීම මෙයින් අදහස් වේ. එම අසත්‍ය ප්‍රකාශ අදාල මැතිවරණයේදී තරග කරන පිළිගත් දේශපාලන පක්ෂයක, ස්වාධින කණ්ඩායමක් හෝ අපේක්ෂකයෙකුගේ මැතිවරණ සම්බන්ධ කතා හෝ කටයුතු සම්බන්ධයෙන් විය යුතුය.

එම අසත්‍ය ප්‍රකාශය මැතිවරණයේ ප්‍රතිඵල කෙරෙහි බලපෑමක් ඇති කළ හැකි එකක් විය යුතුය, එවැනි ප්‍රකාශයක් පළ කරන ප්‍රකාශනයේ අයිතිකරු කළමනාකරු සංස්කාරක, ප්‍රකාශක හෝ ලේඛක ඒ පිළිබඳ වගකීමට බැඳෙනු ඇත. එක් එක් තැනැත්තා විසින් ඒ සඳහා වගකිව යුතු නොවන බවට අවශ්‍ය කරුණු ඔප්පු කිරීමෙන් නිදහස් විය හැකිය.

## ගෙවීමකට මැතිවරණ වැඩට ගැනීම

අපේක්ෂකයෙකුට තමන් වෙනුවෙන් මැතිවරණයේදී අවශ්‍ය කටයුතු සඳහා පුද්ගලයින් සේවයේ යොදවා ගැනීමට ඉඩ ඇත්තේ නීතියේ සඳහන් එවන් සංඛ්‍යාවක් පමණි. ඡන්ද පොළ නියෝජිතයන් ගණන් කිරීමේ නියෝජිතයන් ලිපිකරුවන් පණිවිඩ කරුවන් එසේ සේවයේ යෙදවිය හැකිය. යුක්ති සහගත ප්‍රමාණය ඉක්මවා සේවයේ යෙදවීම නීති විරෝධී ක්‍රියාවක් ලෙස සැලකේ.

## මුද්‍රිත ප්‍රකාශනවල නම සඳහන් කිරීම

මැතිවරණයක් ගැන සඳහන් කරමින් පල කරන ප්‍රචාරක දැන්වීම්, අත්පත්‍රිකා, ප්‍රදර්ශන පත්‍ර හෝ දැන්වීම් ආදියෙහි මුද්‍රණකරුගේ හෝ ප්‍රකාශකයෝ නම් සහ ලිපිනයන් සඳහන් කල යුතුය. එසේ නැතිව එවැනි ප්‍රකාශයන් අලවන නැත්නම් මුද්‍රණය කිරීමට බල කිරීම, බෙදා හැරීමට සලස්වන අපේක්ෂකයෙකු හෝ ඔහුගේ නියෝජිතයෙකු නීතිවිරෝධී ක්‍රියාවකට වරදකරු වන්නේය.

## නීතිවිරෝධී ක්‍රියාවලට දඬුවම්

මහාධිකරණයේ වරදකරු කරනු ලැබුවහොත් දඩය රුපියල් 300කි. එදින සිට අවුරුදු 3කට ප්‍රජා අයිතිය නැති වේ. තෝරාගෙන සිටියොත් මන්ත්‍රීකම අහෝසි වේ. නීතිවිරෝධී ක්‍රියා සම්බන්ධයෙන් නඩු පැවරීමට නීතිපතිවරයාගේ අනුමැතිය අවශ්‍යය.

## ජනාධිපතිවරණ පෙත්සම්

ජනාධිපතිවරණයේදී යම් දූෂණ මැතිවරණ ක්‍රියාවකට හෝ නීති විරෝධී ක්‍රියාවකට හෝ වරදකරු වීම නිසා, ජනාධිපති ලෙස පත් වීම අවලංගු ලක් කළ හැකිය.

- ඡන්ද පෙත්සමක් මගින් මැතිවරණයක් අවලංගු කිරීමට හේතු (සාමාන්‍ය අල්ලස, සංග්‍රහ කිරීම, සාමාන්‍ය බිය ගැන්වීම් හෝ වෙනත් විෂමචාරයක්, ඡන්දය දමීමෙන් වැළක්වීමේ ක්‍රියා හෙවත් මැතිවරණයේ ප්‍රතිඵලයට බලපෑමක් කිරීම)
- මේ පනතේ නීතිය අනුව මැතිවරණ නොපැවැත්වීම.
- අපේක්ෂකයා විසින් හෝ ඔහුගේ දැනුම ඇතිව නියෝජිතයෙකු දූෂණය හෝ නීතිවිරෝධී ක්‍රියා කිරීම මැතිවරණ දූෂණ ක්‍රියාවකට වරදකරුවෙකු වූ තැනැත්තෙකු පෞද්ගලිකව සේවයේ යොදවා ගැනීම
- පාර්ලිමේන්තු සම්මතයෙන් ප්‍රජා අයිතිය අහිමි වුවෙකු මැතිවරණ කටයුතුවල හා සේවයේ යොදවා ගැනීම, තෝරාගනු ලැබූ අවස්ථාවෙහි මන්ත්‍රීවරයෙකු වීමට නුසුදුසු

තැනැත්තෙකු වීම (මේ සම්බන්ධ දිගු ක්‍රියාවලියක් පනත්වල සඳහන් වේ.)

**ජනාධිපතිවරණය පිලිබඳ ඉදිරිපත් ලරන ලද පෙත්සම් ශ්‍රේෂ්ඨාධිකරණයට යොමු කල යුතුය.**

## ඡන්දය දීමට යාම සඳහා නිවාඩු ලබා ගැනීම

ඡන්දය දීමට යාම සඳහා ඡන්ද හිමි සේවකයෙකු විසින් ලිඛිතව ඉල්ලුම් කල විට ඒ සඳහා පැය 4කට නොඅඩු අඛණ්ඩ කාලයක් වැටුප් සහිත නිවාඩු දීමට සෑම සේවා යෝජකයෙක්ම බැඳී සිටි. එසේ නිවාඩු නොදී සිටීම වරදකි. මහේස්ත්‍රාත් උසාවියකින් වරදකරු කොට රුපියල් 500ක දඩයක් හෝ මාසයක සිර දඬුවමක් හෝ ඒ දෙකම හෝ නියම කල හැකිය.